මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 2484500, 011 2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2449823
වෙබ් අඩවිය / இணைய தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/03 - 2019
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.12. 04

**අයවැය චක්‍රලේඛ අංක: 07/2019**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙනයාම**

මහජනතාවට සහන සැලසීම හා ආර්ථික පුනර්ජීවනයක් ඇතිකිරීම අරමුණු කරගෙන බදු ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මෑතකදී සිදුකරන ලද සංශෝධන මේ වනවිටත් ක්‍රියාත්මක කර ඇත. බදු ව්‍යුහයේ ඇතිවූ වෙනස්වීම් සලකා බලා වාහන, ගමන් බිමන්, ගොඩනැගිලි, පහසුකම් ආදිය වෙනුවෙන් කෙරෙන වියදම් ඇතුළුව සියලුම අත්‍යවශ්‍ය නොවන වියදම් සහ ප්‍රමුඛතාවයෙන් අඩු වියදම් කපාහැරීමට කටයුතු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් සියලුම රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙතින් ඉල්ලා ඇති අතර අමාත්‍ය මණ්ඩලය එම ඉල්ලීම අනුව කටයුතු කිරීම අනුමත කර ඇත.

02. නිසියාකාර වියදම් පාලන නිර්ණායක යෙදීමත් එම නිර්ණායක මගින් වියදම් පාලනය වන බව සනාථ කරගැනීමත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි. එහිදී විශේෂයෙන් විදුලි හා ජල පරිභෝජනය, දුරකථන සේවා, ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම්, දේශීය හා විදේශීය ගමන් වියදම් මනා පාලනයකින් යුතුව පවත්වා ගැනීමට හැකිවන පරිදි නිර්ණායක සකස්කර ක්‍රියාත්මක කිරීමට සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වගබලාගත යුතුය. එකී නිර්ණායක, එකඟතාවය ලබා ගැනීම සඳහා 2019.12.10 දින වනවිට අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව (dgma@dma.treasury.gov.lk) ට පිටපතක් සහිතව අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (dgnb@nbd.treasury.gov.lk) වෙත විද්‍යුත් තැපැල ඔස්සේ එවිය යුතුය. මෙහිදී රාජ්‍ය වියදම් දැරීමේ විචක්ෂණශීලීභාවය වර්ධනය කිරීම මැයෙන් වූ ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2019 කෙරෙහිද අවධානය යොමු කලයුතුය.

03. තීරණය කරන ලද නිර්ණායක මත පදනම්ව මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලැබේ. සෑම වියදම් ඒකකයකම අදාල නිර්ණායක ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරනු ලැබූ නිලධරයෙකු සිටිය යුතු අතර එම ආයතනය හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යායුතුය.

04. නව වාහන මිළදී ගැනීම්, කාර්යාල උපකරණ මිලදී ගැනීම් සහ ගොඩනැගිලි කුලියට ගැනීම් සිදු නොකළයුතුය. කෙසේ වුවද, ට්‍රැක්ටර් හා අපද්‍රව්‍ය සම්පීඩක වාහන වැනි මිළදී ගැනීම් අවස්ථානුකූලව මහා භාණ්ඩාගාරය විසින් සළකා බලනු ඇත. වියදම් ඒකක වලට ලබාදී ඇති සම්පත් නිකරුණේ තැබීමෙන් වන පිරිවැය වැලැක්වීම සඳහා සෑම පියවරක්ම ගතයුතුය.

05. ඒකාබද්ධ අරමුදලේ හෝ වෙනත් කිසිදු ව්‍යවස්ථාපිත අරමුදලක මුදල් උපයෝගී කරගෙන 2020 වර්ෂය සඳහා දිනපොත් හා කැලැන්ඩර් මුද්‍රණය කිරීම සිදු නොකළ යුතුය.

06. ඉහත උපදෙස් පරිදි කටයුතු කර, කාර්යක්ෂම වියදම් පාලනයක් සහ මූල්‍ය විනයක් පවත්වා ගනිමින් ආර්ථික පුනර්ජීවනයක් ඇතිකිරීම සඳහා වන රජයේ ක්‍රියාදාමයට සහයෝගය ලබාදෙනු ඇතැයි සියලුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන්දීමේ නිලධාරීන්වෙතින් අපේක්ෂා කරන බව අවධාරණය කරමි.

**එස්.ආර්.ආටිගල**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති
(v). අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව